# 3 අපේ සංස්කෘතික උරුමය

### හැඳින්වීම

අනුරාධපුරය, පොළොන්නරුව වැනි පැරණි නගර ගැන කතා කරන විට අපේ අතීත ශිෂ්ටාචාරය පිළිබඳ සිහියට නැගේ. අපේ අතීත මුතුන් මිත්තන් විසින් සාදන ලද ගොඩනැගිලි, මූර්ති, වැව් අමුණු, පොකුණු ආදියෙහි ඉතිරිව ඇති කොටස් එහි දක්නට ඇත. එවා අපේ ජාතික වස්තූන් ලෙස සලකා ආරක්ෂා කරන අතර මෙම ජාතික වස්තූන් රටේ ජාතික උරුමයන් ලෙස ද සැලකේ. අපේ ජාතික උරුමයන් හා ඒවා ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව මෙම පාඩමේ දී ඔබේ අවධානය යොමු කෙරේ.

### සංස්කෘතික උරුමය යනු කුමක් ද?

වැසි ජලය රැස් කිරීමට අතීතයේ තැනවූ විශාල වැව්, එම වැව්වල හා වැව් බැම්වල විශාලත්වය එහි ඇති තාක්ෂණය කෙනෙකු පුදුම කරවීමට තරම් සමත් ය. එසේ ම අපේ මුතුන් මිත්තෝ කළු ගල් ඔප මට්ටම් කර විවිධ නිර්මාණ කර වූහ.

මෙසේ භෞතික වස්තූන් පමණක් නොව අනාදිමත් කාලයක සිට පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන සිරිත් විරිත්, ඇදහිලි හා විශ්වාස, ජන ගායනා, ජන නැටුම්, ජන කතා, කලා ශිල්ප, සාම්ප්‍රදායික වෛද්‍ය දැනුම ආදිය ද අපේ සංස්කෘතික උරුමයට අයත් වේ. පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ ඉහත සඳහන් විවිධ අංශ පිළිබඳ දැනුම



රූපය 3.1 රන්මසු උයන



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 3.2 නිශ්ශංකලතා මණ්ඩපය

වර්තමානයේ ද තම ජීවිතයේ එදිනෙදා මුහුණදෙන ගැටලු විසඳා ගැනීම සඳහා භාවිත කළ හැකි ය. අපේ රටේ අතීතයෙන් උරුම වූ විවිධ අත් බෙහෙත්, වගාවන් සඳහා භාවිත කරන කෙම් ක්‍රම ඊට උදාහරණ කිහිපයකි.

ඉතා පැරණි ඉතිහාසයක් ඇති රටක් ලෙස අපි සංස්කෘතික උරුමයන් රැසක හිමිකරුවෝ වෙමු. ඒ අතර ආගමික ස්ථාන, රජ මාලිගා, බලකොටු සහ උද්‍යාන මෙන් ම තවත් බොහෝ ඓතිහාසික ස්ථාන, ගොඩනැගිලි, විවිධ කලා නිර්මාණ, ආහාර පාන, සම්ප්‍රදායන්, චාරිත්‍ර වාරිත්‍ර, ආදී උරුමයන් රැසක් අප සතුව පවතී. මේ සියල්ල අපේ සංස්කෘතික උරුමයන් ලෙස හැඳින්විය හැකිය.3.1 රූපයෙහි දැක්වෙන්නේ අනුරාධපුරයෙහි පිහිටි රන්මසු උයනේ ඡායාරූපයකි. 3.2 රූපයෙන් පොළොන්නරුවේ පිහිටි නිශ්ශංකලතා මණ්ඩපය දැක්වේ. මේවා අපේ සංස්කෘතික උරුමයන්ට උදාහරණ වේ.

එසේ ම මෙම උරුමයන් අපට අවශ්‍ය නම් අතින් අල්ලා වුවත් බැලිය හැකි ය. එනම් ස්පර්ශ කළ හැකි ය. එම නිසා මෙම උරුමයන් ස්පෘශය උරුම ලෙස හැඳින්වේ. ඒ අනුව අපේ රටේ පිහිටි ආගමික ස්ථාන, රජ මාලිගා, බලකොටු, උද්‍යාන මෙන් ම තවත් බොහෝ ඓතිහාසික ස්ථාන, ගොඩනැගිලි වැනි විවිධ කලා නිර්මාණ, වැව්, පොකුණු, ඇළවේලි හා වැව් අමුණු සහ පැරණි පොත් පත් ආදිය අපට ස්පර්ශ කළ හැකි ඒවා වන බැවින් ඒවා ස්පෘශය උරුමය ලෙස හඳුනාගත හැකි ය.

බුලත් අතක් දී වැඩිහිටියන්ට වැඳීම, අලුත් අවුරුද්දට ආගමික වතාවත්වල යෙදීම වැනි දේ අපට පෙර සඳහන් කළ උරුමයන් මෙන් අතින් ඇල්ලිය නොහැකි එනම් ස්පර්ශ කළ නොහැකි හැසිරීම් හෙවත් ක්‍රියාකාරකම් වේ. ඒවා අපට පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ චාරිත්‍ර වාරිත්‍ර වේ. එවැනි උරුමයන් අස්පෘශය උරුමයන් ලෙස හඳුන්වයි. යම් ජාතියකට අයත් ජනශ්‍රැති, සම්ප්‍රදායන් හා විවිධ භාෂාවන්, ජන නැටුම්, ජන ගීත සහ විවිධ කලාවන් පිළිබඳ දැනුම චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත්, ඇදහිලි හා විශ්වාස, විවිධ කෙම් ක්‍රම යනාදිය ද අස්පෘශය උරුමයට අයත් වේ. දැන් අපි මේ පිළිබඳව තවදුරටත් සොයා බලමු.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ස්පෘශය උරුමය

අතින් ස්පර්ශ කළ හැකි උරුම ස්පෘශය උරුමයට අයත් වූ බව ඉහත පැහැදිලි කර ඇත. ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවත් ඉතා පැරණි ඉතිහාසයක් ඇති ස්පෘශය උරුමයන් රාශියක් පිහිටි රටක් වේ. මේ පිළිබඳ විවිධ සාධක දිවයින පුරා පිහිටි විවිධ ස්ථානවලින් සොයාගෙන තිබේ. පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් භෞතික වස්තූන් මෙන් ම, ඉතා දියුණු වාරි සංස්කෘතියක් ද අප සතු ය. මේවා අපේ රටේ අනන්‍යතාව පෙන්වන සාධකයන් ය.

මෙලෙස සංස්කෘතික උරුමයන් රැසක් අප සතු බැවින් අභිමානවත් ජාතියක් ලෙස ලෝකය ඉදිරියේ පෙනී සිටීමට අපට හැකියාව ලැබී ඇත.

ලෝකයේ විවිධ සංස්කෘතීන් ඉදිරියේ ශ්‍රී ලාංකික අනන්‍යතාව අභිමානයෙන් යුතුව පෙන්වා දීමට අපේ සංස්කෘතික උරුමය අපට උපකාර වේ.

අපේ පැරණි වැව් අමුණු හා පොකුණු සඳහා යොදා ඇති තාක්ෂණය, මහා කළු ගල්වලින් කරන ලද නිර්මාණ, සීගිරිය, ඇම්බැක්කේ ලී කැටයම් ආදිය ලොව කිසි රටකට නොදෙවෙනි නිර්මාණ වේ. මේවා අතීතයෙන් උරුම වූ අපේ කම, අපගේ අනන්‍යතාව පෙන්වන ජීවමාන සාක්ෂි බඳු ය.

### ක්‍රියාකාරකම

අපේ රටේ පැරණි කෞතුක වස්තූන්වල පින්තූර එකතු කර පොතක් සකස් කරන්න.

## ලෝක සංස්කෘතික උරුම

අපේ රටට මෙන් ලෝකයේ සෙසු රටවලට ද තම රටට ම සුවිශේෂ වූ සංස්කෘතික උරුමයන් ඇත. ඒවා අතරින් ඉතා දුර්ලභ ඉහළ අගයෙන් යුත් සංස්කෘතික උරුම ඒ රටට පමණක් නොව සමස්ත මානව ප්‍රජාවට අයිති පොදු උරුමයක් බවට පත් කර ඇත. මෙම කාර්යය එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ක්‍රියාකාරි සංවිධානය වන යුනෙස්කෝ ආයතනය විසින් සිදු කරනු ලබයි. එකී උරුමවලට යම් කිසි හානියක් හෝ විනාශයක් වීමට ඉඩ නො තබා ඒවා ආරක්ෂා කිරීම යුනෙස්කෝ සංවිධානයේ කාර්ය භාරය වේ. ක්‍රි. ව. 2011 වන විට එම සංවිධානය විසින් සංස්කෘතික උරුම 704ක් ලෝක උරුම ලෙස නම් කර ඇත. ඉන් හයක් ශ්‍රී ලංකාවේ පිහිටි ඒවා වේ.

ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක සංස්කෘතික උරුම පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර ලෝක සංස්කෘතික උරුම තෝරා ගන්නා ආකාරය පිළිබඳ අපි සොයා බලමු.

යුනෙස්කෝ සංවිධානය විසින් විවිධ රටවල ලෝක සංස්කෘතික උරුම තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනු ලැබේ.

- ❖ මිනිසාගේ විශිෂ්ට නිර්මාණශීලිත්වය හෝ බුද්ධිමත් බව දක්වෙන නිර්මාණ වීම.
- ❖ යම් කිසි සංස්කෘතියකට අයත් ගෘහ නිර්මාණ, නගර සැලසුම්, කලාව, තාක්ෂණය ආදියෙහි සංවර්ධනය පෙන්වා දීමට හැකි නිර්මාණ වීම.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.


❖ දැනට පවතින හෝ අතුරුදහන්ව ඇති පැරණි ශිෂ්ටාචාරයක්, එබඳු ශිෂ්ටාචාරයක් පැවති බව පෙන්වන ප්‍රබල සාක්ෂියක් වීම.

❖ මානව ඉතිහාසයේ වැදගත් අවස්ථා නිරූපණය වන ගොඩනැගිලි, ගෘහ නිර්මාණ ශිල්පය හෝ තාක්ෂණය සඳහා නිදර්ශනයක් වීම.

❖ නොවැලැක්විය හැකි හේතූන් මත විනාශ වීමේ තර්ජනයට ලක් වී ඇති ඉපැරණි සමාජයක වාසභූමියක් හෝ ඊට අයත් ස්මාරකයන් වීම.

යුනෙස්කෝ සංවිධානය කිසියම් රටක ඓතිහාසික ස්ථානයක් හෝ ස්මාරකයක් ලෝක සංස්කෘතික උරුමයක් ලෙස ප්‍රකාශ කිරීම එම රටේ සියලු ජනතාවට ආඩම්බර විය හැකි කරුණකි. අපේ අසල්වැසි රට වන ඉන්දියාවේ පහළොවකට වැඩි සංස්කෘතික උරුමයන් ප්‍රමාණයක් යුනෙස්කෝ සංවිධානය මගින් ලෝක උරුම ලෙස නම් කර ඇත. චීනයෙන් සංස්කෘතික උරුම විස්සකට වැඩි ප්‍රමාණයක් ලෝක සංස්කෘතික උරුම ලැයිස්තුවට එක් කර තිබේ.

**පැරණි මොහෙන්දජාරෝ නගරය**



රූපය 3.3

මෙය අතීත නගර නිර්මාණ පෙන්වන ලෝක සංස්කෘතික උරුමකි.

පකිස්ථානයේ පිහිටි මොහෙන්ජොදරෝ නගරය අතුරුදහන්ව පැවති ශිෂ්ටාචාරයක් ලෙස හා පැරණි නගර නිර්මාණ ශිල්පයට සාක්කියක් ලෙස ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කර ඇත.

**චීන මහා ප්‍රාකාරය**



රූපය 3.4

අතීත ආරක්ෂිත පවුරක් ලෙස නම් කෙරුණු ලෝක සංස්කෘතික උරුමයකි.

චීනයේ පිහිටි මෙය ආරක්ෂිත පවුරක් ලෙස ගොඩ නැංවූවක් වන අතර චීන සංස්කෘතියේ ප්‍රබල සංකේතයකි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම

ඉහත සඳහන් මොහෙන්දජාරෝ නගරය හා චීන මහා ප්‍රාකාරය වෙනත් රටවල පවතින ලෝක සංස්කෘතික උරුමවලට උදහරණ වේ. දැන් අපි ශ්‍රී ලංකාවෙන් ලෝකයට දායාද වූ ලෝක සංස්කෘතික උරුම පිළිබඳ සොයා බලමු.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම ස්ථාන හයක් මේ වනවිට යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම ලෙස පිළිගෙන තිබේ. ඒවා මෙසේ ය.

1. පැරණි අනුරාධපුර නගරය
2. පැරණි පොළොන්නරුව නගරය
3. සීගිරිය
4. රන්ගිරි දඹුලු ලෙන් විහාරය
5. මහනුවර දළදා මාලිගය
6. ගාලු කොටුව

මෙසේ ස්ථාන හයක් ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් වීම නිසා ශ්‍රී ලංකාව කුඩා රටක් වුව ද එහි ප්‍රෞඪ ඉතිහාසය සහ සංස්කෘතික වැදගත්කම පිළිබඳව ලෝකය ම දැනුම්වත් වී ඇත. මේ නිසා එකී ස්ථාන දැක බලා ගැනීමට සංචාරකයෝ නිරතුරුව පැමිණෙති. මෙමගින් අපේ අතීත අභිමානය ලෝකය හමුවේ ප්‍රකාශ කිරීමට හැකියාව ලැබී ඇත. එබැවින් ඓතිහාසික උරුමය සොයා බලා ඒවා රැක ගැනීම අපේ වගකීමකි.



රූපය 3.5

### පැරණි අනුරාධපුර නගරය

ශ්‍රී ලංකාවේ පැරණි අගනුවර වූ අනුරාධපුර නගරය තුළ ශ්‍රී මහබෝධිය, රුවන්වැලිසෑය, ලෝවාමහාපාය, අභයගිරිය, ජේතවනාරාමය, කුට්ටම් පොකුණ, ඇත් පොකුණ, ඉසුරුමුණිය විවිධ පැරණි ගොඩනැගිලි, රන්මසු උයන වැනි උද්‍යාන ආදිය ද දක්නට ලැබේ. මෙම නිර්මාණවල ඓතිහාසික වැදගත්කම හා සංස්කෘතිකමය වටිනාකම සලකා 1982 දී එම නගරය ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කෙරිණ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.




රූපය 3.6

**පැරණි පොළොන්නරු නගරය**

දොළොස්වන හා දහතුන්වන සියවස වන විට පොළොන්නරුව ඉතා සශ්‍රීක අගනගරයක් විය. නටබුන්ව ගිය බෞද්ධ හා හින්දු සිද්ධස්ථාන හා රජවරුන්ගේ විශිෂ්ට නිර්මාණ රැසක් මෙම ස්ථානයේ දක්නට ලැබේ. මෙහි ඇති බෞද්ධ හා හින්දු ස්මාරක වන වටදාගෙය, තිවංක පිළිම ගෙය, රන්කොත් වෙහෙර, කිරි වෙහෙර, ලංකාතිලකය, රජ මාලිගා, නිශ්ශංක ලතා මණ්ඩපය, ගල් විහාරය, ශිව දේවාල, සත්මහල් ප්‍රාසාදය හා පරාක්‍රම සමුද්‍රය වැනි අතිවිශිෂ්ට නිර්මාණ නිසා පැරණි පොළොන්නරුව නගරය 1982 දී ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කෙරිණ.

**සීගිරිය**



රූපය 3.7

කාශ්‍යප රජු විසින් ගොඩනගන ලද සීගිරිය පැරණි බලකොටුවක්, රජ මාලිගයක් හා කලාගාරයක් වශයෙන් ද ඉතා වැදගත් ස්ථානයකි.

එහි වැදගත්කම සලකා 1982 දී එම ස්ථානය ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කර ඇත. මේ පිළිබඳ වැඩි විස්තර විස්මිත සීගිරිය යන මාතෘකාව යටතේ දක්වා ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 3.8

**දඹුලු රජ මහා විහාරය**

මෙය ශ්‍රී ලංකාවේ ඇති පැරණි සිතුවම් සහිත විශාල ම ලෙන් විහාරය වේ. ස්වාභාවික ගල තුළ නිර්මාණය කළ බෞද්ධ විහාරයක් වන මෙය ඉතා සිසිල් සුවදයක ස්ථානයකි. මෙහි ඇති විශිෂ්ට සිතුවම් නිසා 1991 දී ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කෙරිණි.



රූපය 3.9

**ගාලු කොටුව**

පෘතුගීසි ජාතිකයන් විසින් කුඩාවට ගොඩනගා තිබූ ගාලු කොටුව ලන්දේසීන් විසින් ආරක්ෂක බලකොටුවක් ලෙස වඩා ශක්තිමත්ව හා විධිමත්ව ගොඩනගන ලදි.

ඒ අනුව ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පයට අයත් ගොඩනැගිලි සහ පුරාවිද්‍යාත්මක ස්මාරක, රැසක් මෙම කොටුව තුළ අදටත් දක්නට ලැබේ. දකුණු මුහුදු තීරයේ දර්ශනීය වට පිටාවක පිහිටි ගාලු කොටුව තුළ ඇති පෞරාණික ඉදිකිරීම් නිසා 1988 වර්ෂයේ දී එය ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කෙරිණ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

#### මහනුවර ශුද්ධ නගරය



රූපය 3.10

මහනුවර නගරයේ ඉතිහාසය, එහි ඇති පැරණි ගොඩනැගිලි හා වර්තමානයේ පවා එම නගරය ආශ්‍රිත ව සිදු වන ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ සලකා බලා 1988 වර්ෂයේ දී එය යුනෙස්කෝ ලෝක උරුමක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණ. දළදා මාලිගාව, පැරණි රජ වාසල, මගුල් මඩුව මහනුවර නගරයේ පවතින පැරණි ගොඩනැගිලිවලට උදාහරණ වේ. මහනුවර ඇසල පෙරහර, මෙරට පැරණි සිරිත් විරිත් හා සාම්ප්‍රදායික කලා කුසලතා පෙන්නුම් කෙරෙන සංස්කෘතිකාංගයකි.

#### විස්මිත සීගිරිය



රූපය 3.11



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ පිහිටි සංස්කෘතික උරුම අතරින් සීගිරිය ලෝක උරුමයක් බවට පත්ව ඇති බව මීට පෙර සඳහන් කෙරිණ. අපි දැන් ඒ විස්මිත උරුමය පිළිබඳව තව දුරටත් සොයා බලමු.

කාශ්‍යප රජු විසින් තනන ලද සීගිරිය පිළිබඳ විවිධ මතවාද පවතී. සිය පියා වූ ධාතුසේන රජු ඝාතනය කර රජකම ලබා ගත් කාශ්‍යප විසින්, මුගලන් නම් තම සොහොයුරාට බියෙන් ආරක්ෂාව සඳහා සීගිරි පර්වතයේ බලකොටුවක් ඉදි කළ බව මූලාශ්‍රයවල දැක්වේ. සීගිරියේ ඇති විශිෂ්ට ගෘහ නිර්මාණ ශිල්පය, කැටපත් පවුර, සීගිරි චිත්‍ර, සීගිරි පියගැටපෙළ, සිංහ පාද, උද්‍යාන, පොකුණු, දිය අගල ආදිය පිරික්සා බැලීමේ දී එය බලකොටුවක් මෙන් ම විශිෂ්ට කලාගාරයක් බව ද පෙනී යයි.



රූපය 3.13 සිංහ පාදය හා පියගැට පෙළ

## සීගිරියේ ගෘහ නිර්මාණ ශිල්පය

මුහුදු මට්ටමේ සිට අඩි 1214ක් උසින් වනලැහැබක් තුළ පිහිටි කඳු ගැටයක් මත වූ ගල් පර්වතය මුදුනේ පැරණි රජ මාලිගාව හා වෙනත් ගොඩනැගිලිවල නටබුන් අදටත් දක්නට ලැබේ. ගල මුදුනේ නටබුන් සහිත ප්‍රදේශය අක්කර තුනක් පමණ වේ.

ගල මුදුන දක්වා අතීතයේ ඉදි කර තිබූ මාවත පඩි පේළි, පාලම්, ප්‍රාකාර ආදියෙන් යුත් අපූර්ව නිර්මාණයකි. ගලේ දුෂ්කර කොටසට නැගීමට තිබූ මාර්ගය සිංහ මුඛයකින් ආරම්භ විය. එකී ප්‍රතාපවත් සිංහ රූපය නිසා මේ ස්ථානයට සීහගිරි හෙවත් සීගිරි යන නම යෙදූ බව පෙනේ. සිංහ රූපය සහිත ප්‍රදේශයට පැමිණීමට පෙර ගමන් මාර්ගයේ ආරක්ෂාව සඳහා තනවා තිබූ දික් පවුරේ ඇතුළු පැත්ත බොහෝ ඔප මට්ටම් කොට තනවා තිබිණ. එය කැටපත් පවුර ලෙස ප්‍රකට ය. එම පවුරේ ලියා ඇති ගී සීගිරි කුරුටු ගී ලෙස හැඳින්වේ.



රූපය 3.12 කැටපත් පවුර

## සීගිරි සිතුවම්

සීගිරියේ පිය ගැට පෙළ ඉහළට නැගීමෙන් පසුව ලෙන් තුළ ඇති සීගිරි සිතුවම් දැකිය හැකි ය. පර්වතය පාමුල ඇති ලෙන්වල ද සිතුවම් කොටස් දැකිය හැකි නමුත් සීගිරි සිතුවම් ලෙස වඩාත් ප්‍රචලිත, පර්වත



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කෙවෙනිවල ඇති ස්ත්‍රී රූප වේ. වලාකුළු වලින් මතු වූ උඩුකය පෙනෙන ස්ත්‍රී රූප ලෙස මෙම සිතුවම් නිර්මාණය කර තිබේ. වසර 1500ක් තරම් පැරණි මෙම සිතුවම් විශිෂ්ට කලා නිර්මාණ ලෙස ලෝකය පුරා ප්‍රසිද්ධියට පත්ව තිබේ.



රූපය 3.14 සීගිරි උද්‍යානය

## සීගිරි උද්‍යානය

සීගිරි කඳු මුදුනේ සිට බලන විට බටහිර විශාල පෙදෙසක මඟුල් උයන හෙවත් උද්‍යානය ව්‍යාප්තව තිබේ. පරණවිතාන මහතා මෙය ප්‍රමද වනය ලෙස නම් කළේ ය. සීගිරි උද්‍යානය ජල උද්‍යානයකින් සමන්විත වේ.



රූපය 3.15 සීගිරි සිතුවම්

## සීගිරියේ පොකුණු හා ජල තාක්ෂණය

සීගිරියේ ජලමල් තාක්ෂණය විශිෂ්ට නිර්මාණයකි. සීගිරි ගෘහ නිර්මාණ ශිල්පියා ජල මල් සැකසීමේ දී වේගවත්ව ගලන ජල පහරකට බාධාවක් යෙදීමෙන් ජලය ඉහළට ගත හැකි ය, යන සංකල්පය විද්‍යාත්මකව කල්පනා කළ අයෙකි.

මේ අනුව ඉහළ පොකුණුවල සිට වේගයෙන් පහළට ගලන ජල ධාරාවකට පින්තූරයේ පෙනෙන අයුරු සිදුරු කළ ගල් පතුරු යෙදීමෙන් ජල මල් අලංකාරව නිර්මාණය කර ඇත. මෙම ජල මල් වර්තමානයේ ද වර්ෂාව ඇති කාලයේ දී ක්‍රියාත්මක වේ.

සැබවින් ම සීගිරිය අතිවිශිෂ්ට නිර්මාණයක් වූ බව ඔබට දැන් වැටහෙනු ඇත.

ගල මුදුනේ විශාල මාළිගාවක් තැනීම, ඊට අදාළ ද්‍රව්‍ය ප්‍රවාහනය කළ ආකාරය, ආදී වශයෙන් වර්තමානයේ මෙන් පහසුකම් නොමැති යුගයක මෙම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



රූපය 3.16 ජලමල්

ගෙන යාමට හැකියාව ලබා දුන් මේ හෙළ නිර්මාණකරුවන්ගේ විස්මිත හැකියාවන් නිසා අද අපට ජාතියක් වශයෙන් ආඩම්බර විය හැකි ය.

### ක්‍රියාකාරකම

1. ශ්‍රී ලංකාවේ ඇති ලෝක සංස්කෘතික උරුමවල පින්තූර ඇතුළත් පොතක් සකස් කරන්න.
2. සීගිරිය පිළිබඳ පොත් පිංචක් සකස් කරන්න.

මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.

නිර්මාණ කළ ආකාරය ඉතා විස්මිත ය. එය ලොව කොතැනකින් වත් දැකිය නොහැකි වූ ආකාරයේ විශිෂ්ට ම නිර්මාණයකි. මේ පුංචි ශ්‍රී ලංකාවේ විශිෂ්ටත්වය ලෝකයට



රූපය 3.17 නාන පොකුණ



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## අස්පෘශය උරුමය

"පුතේ ගොම්මන් වෙලාවට තනියම දියකඩිති ගානේ ඇවිදින්න යන්න එපා" යැයි අපේ අත්තම්මා හෝ සීයා පවසනු ඇතැම් විට ඔබ අසා ඇත. එයින් ඇඟවෙන්නේ හිරු බැස යන වෙලාවක තනියම ගමන් බිමන් යාම සුදුසු නැති බවට අපේ විශ්වාසයක් පැවති බවයි. එවැනි විශ්වාස, සිරිත් විරිත් පිළිබඳ අපේ අත්තම්මලා සීයලා අපට කියා දුන් අයුරු අපට තාම මතක ය. ඔවුන්ට ඒවා පිළිබඳ අවබෝධය ඔවුන්ගේ වැඩිහිටියන් විසින් ලබා දෙන්නට ඇත. එසේ පරම්පරාවෙන් පරම්පරාවට ඒ ඒ ජන කණ්ඩායම් විසින් රැගෙන එන සංස්කෘතික උරුමය අස්පෘශ්‍ය උරුමය ලෙස හඳුන්වයි. මෙම උරුමය පැරණි ගොඩනැගිලි චිත්‍ර මූර්ති, මෙන් ස්පර්ශ කළ නොහැකි ඒවා ය. යුනෙස්කෝ සංවිධානය අස්පෘශ්‍ය උරුමයන් විද්‍යමාන වන ආකාර පහක් හඳුනාගෙන ඇත. ඒ අනුව විවිධ රටවල සමාජයන්හි අනන්‍යතාවය හඳුනාගත හැකි ඒවා නම්,

1. ජනවහර හා අදහස් ප්‍රකාශ කිරීම
2. රංග කලාව, ජනකවි, ජන සංගීත
3. සමාජීය පුරුදු, ඇදහිලි, විශ්වාස සහ උත්සව
4. ස්වභාව ධර්මය හා විශ්වීය ආභාසයෙන් ඇති වූ දැනුම හා පුරුදු
5. සාම්ප්‍රදයික කලා ශිල්ප

ආදිය වේ.

ඉහත ක්ෂේත්‍ර අනුව අප මාතෘ භූමියෙන් අපට උරුම වූ අස්පෘශ්‍ය උරුමයන් මගින් අපේ අනන්‍යතාව හඳුනාගත හැකි ය. දැන් අපි ඒ පිළිබඳව සොයා බලමු.

## ජනවහර හා අදහස් ප්‍රකාශ කිරීම

මෙරට වර්තමානයේ කතා කරන සිංහල භාෂාවට වසර දෙදහස් පන්සියයක පමණ ඉතිහාසයක් ඇති අතර දෙමළ භාෂාවට ද එබඳු ම ඉතිහාසයක් තිබේ.

මෙසේ දිගු කාලයක් එම භාෂා භාවිත කිරීම නිසා ඒවාට ම ආවේණික භාෂා ශෛලීන් ගොඩනැගී තිබේ. එසේ ම උපමා, රූපක, ආප්තෝපදේශ, පිරුළු වැනි විවිධ දේවලින් මෙම භාෂා පෝෂණය වී තිබේ.

සිංහල භාෂාවට දෙමළ බසෙන් මෙන් ම අතීතයේ පැවති වෙනත් භාෂාවලින් ද ආභාසය ලැබී ඇත. දෙමළ භාෂාව ද සමකාලීන වෙනත් භාෂාවලින් පෝෂණය වූවකි. එබැවින් භාෂාව ව්‍යවහාරය කරන ආකාරය පිළිබඳ ලංකාවට ම ආවේණික ශෛලියක් හා සම්ප්‍රදයක් පවතී. එය අපේ අස්පෘශය උරුමයකි.

## රංග කලාව

වර්තමානයේ අපේ සංස්කෘතිය හා බැඳුණු රංග කලාවක් මෙරට පවතී. එය ද අතීත උරුමයේ ප්‍රතිඵලයකි.

රුවන්වැලි සෑයට මුල්ගල් තැබීමේ උත්සවයේ දී දුටුගැමුණු රජතුමා දිව්‍ය කන්‍යාවන් හා සමාන නාටිකාවන් සහ නොයෙක් තූර්ය නාදයන් සහිත සමූහයක් පිරිවරාගෙන පුදබිමට පැමිණි බව මහාවංසයේ සඳහන් වේ.

වර්තමානයේ ඇතැම් උත්සවවලට විශේෂ ආරාධිතයන් කැඳවාගෙන ඒමේ දී නැටුම් ගැයුම් තූර්යවාදන යොදා ගනු ඔබ දැක ඇත. එය අතීතයේ සිට මෙරට පවතින සම්ප්‍රදයක් බව දුටුගැමුණු රජතුමා පිළිබඳ උදහරණයෙන් පෙනේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී විවිධ අවස්ථාවල නැටුම් ගැයුම් පැවති බව වාර්තා වේ. එතුමා නැටුම් ගැයුම් පැවැත්විය හැකි ගොඩනැගිලි පවා ඉදි කරවා ඇත. එම රජුගේ බිරිඳ වූ **රූපවතී බිසව** නැටුම් ගැයුම් සඳහා දක්ෂතාවක් තිබූ කාන්තාවක බව මහාවංසයේ දැක්වේ.

ශ්‍රී ලංකාවේ අතීතයේ පැවති නැටුම් ගැයුම් ආදි කලා කටයුතු ගැන මහාවංසය, කව්සිළුමිණ, සද්ධර්මාලංකාරය වැනි කෘතිවල සඳහන් වේ. දෙවන පරාක්‍රමබාහු රජතුමා 'නානාප්‍රකාර නැටුමෙන් හා මධුර ගීතිකායෙන් යුත්' උත්සවයක් පැවැත්වූ බව මහාවංසය කියයි. අතීත නැටුම්, ගැයුම් කටයුතුවල දී විවිධ බෙර වර්ග, වීණාව, නලාව වැනි තූර්ය භාණ්ඩ භාවිත කර ඇත. පැරණි නැටුම් ගැයුම් කලාවේ ඇතැම් ශේෂයන් සාම්ප්‍රදායික ශාන්තිකර්ම තුළ ද දක්නට ලැබේ. මහනුවර ඇසළ පෙරහැර මෙබඳු නැටුම් ගැයුම් දක්නට ලැබෙන තවත් අවස්ථාවකි.

ජන කවිය ද අපේ සංස්කෘතික උරුමයේ කොටසකි. බොහෝ විට රංග කලාව ආගමික පුද පූජා පැවැත්වීම සඳහා යොදා ගත් බව පැහැදිලි වේ. විසිතුරු ඇඳුමින් සැරසී විවිධ පුද පූජා පැවැත්වීම සඳහා ශිල්පීන් රංගනයේ යෙදී ඇත. වර්තමානයේ දී ද ආගමික උත්සව පමණක් නොව වෙනත් විවිධ උත්සව අවස්ථාවන් සඳහා නැටුම්, ගැයුම්, තූර්යවාදන යොදා ගත් අවස්ථා ඔබ දැක ඇත. එය අපේ අස්පෘශය උරුමය ලෙස හැඳින්විය හැකි ය.

## ජන කවි

මෙරට බොහෝ ප්‍රදේශවල ඒ ඒ පෙදෙස්වලට ආවේණික වූ ජන කවි පවතී. එම ජන කවි වර්තමාන පරම්පරාවට ලැබී ඇත්තේ ඊට පෙර සිටි වැඩිහිටියන්ගේ ගායනාවලට සවන් දීමෙනි. එනම් මුඛ පරම්පරාගතව ය. එබැවින් ජන කවි හා විවිධ ජන ගායනා ආදිය ද පරපුරෙන් පරපුරට පැවත ආ අස්පෘශ්‍ය උරුමයක් ලෙස සැලකිය හැකි ය. ධාතුසේන රජතුමා කලා වැව තැනවීම ගැන අනුරාධපුර ප්‍රදේශයේ පවතින ජනකවියක් මෙසේ ය.

| | |
|---|---|
| කලා ඔයේ දිය පහරට යන්ට | බැරී |
| හිටියේ කල වැලක් ඔය හරහට | වැතිරී |
| එතන හොඳයි වැවකට දිය කඳ | ඉතිරී |
| කලා වැව බැන්දෙ දසෙන් රජුය පින් | පිරී |

මෙබඳු ජනකවි නිර්මාණය කළ තැනැත්තා හෝ කාලය පිළිබඳ තොරතුරු බොහෝ විට අප්‍රකට ය. පැරණි ගොයම් කවි, පැල් කවි, කරත්ත කවි, පතල් කවි, පාරු කවි ආදිය වෙහෙස මහන්සිය නිවා ගැනීම, තනිකම පාළුව මගහරවා ගැනීම පිණිස ප්‍රබන්ධ කොට ගායනා කළ ඒවා වේ. ඒ ඒ කටයුතුවල දී අතීත මිනිසුන් ලැබූ අත්දැකීම් හා විවිධ වෘත්තීන්වල එකල ස්වභාවය ආදිය තේරුම් ගැනීමට ද මෙබඳු ජන කවි වැදගත් වේ.

එසේ ම දෙමාපියන්ගේ සහ වැඩිහිටියන්ගේ ගුණ ගැයීම, දරු සෙනෙහස ප්‍රකාශ කිරීම, බාල පරපුර සුමගට ගැනීම, කුසගින්න දැක්වීම, ඥාතීන් අතර සම්බන්ධතා ප්‍රකාශ කිරීම සඳහා ද ජන කවිය යොදාගෙන තිබේ. ඒ අනුව සිතක උපන් සංවේදී හැඟීමක් නිර්මාණාත්මකව ප්‍රකාශ කිරීමත් එය තාලයකට අනුව ගායනා කොට වින්දනයක් ලබා ගැනීමත් ජන කවියෙන් සිදු ව තිබේ. මෙවැනි නිර්මාණාත්මක ජන ගීත ඕනෑ ම සමාජයක ජන කණ්ඩායම් සතු ය.

**ක්‍රියාකාරකම**

ජන කවි ඇතුළත් පොතක් සකස් කරන්න.



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

## සමාජීය පුරුදු හා විශ්වාස

විවිධ සමාජීය පුරුදු හා ඇදහිලි විශ්වාස ආදිය ද පරපුරෙන් පරපුරට පැමිණි අස්පෘශ්‍ය උරුමයකි. විහාරස්ථාන හෝ දේවස්ථානවලට ඇතුළු වීමේ දී පාවහන් හා හිස්වැසුම් ගැලවීම, දෙමාපියන් වැඩිහිටියන් හා ගුරුවරුන්ට දණ ගසා වැඳීම හා ගෞරව කිරීම, අත් සෝදා ආහාර ගැනීම, සතුන්ට කරුණාව දැක්වීම, නැති බැරි අයට උපකාර කිරීම වැනි දේ පරපුරෙන් පරපුරට උරුම වූ යහපත් පුරුදුවලට උදාහරණ වේ. මෙබඳු සාම්ප්‍රදායික උරුමයන් දැකීමෙන් අප තුළ නිහතමානීකම කරුණාව, දයාව, ආචාරශීලීභාවය වැනි උසස් ගුණාංග වර්ධනය වේ.

## උත්සව පැවැත්වීම

වර්තමාන සමාජයේ විවිධ උත්සව පවතින බව ඔබ දැක ඇත. අතීත සමාජයේ ද මිනිසකුගේ උත්පත්තියේ සිට මරණය දක්වා විවිධ උත්සව පැවතුණි. අනුරාධපුර රාජ්‍ය සමය තරම් ඈත කාලයේ ඇතැම් උත්සව මෙරට සමාජයට හුරු වූයේ අසල්වැසි ඉන්දියාවේ පැවති හින්දු සිරිත් විරිත්වල ආභාසයෙනි. කෙනෙකුගේ උත්පත්තියේ සිට අධ්‍යාපන කටයුතු ආරම්භ කරන තෙක් ඉටු කළ යුතු සිරිත් විරිත් ගැන පැරණි හින්දු පොත් පත්වල සඳහන් වේ. එබඳු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**ජාත කර්ම** - උපතේ දී සිදු කළ යුතු සිරිත් විරිත්,

**නාමකරණ** - නම් තැබීම

**කර්ණවේදන** - කන්විදීම

**අන්නප්‍රාශාන** - ඉඳුල් කටගෑම

**විද්‍යාරම්භ** - අධ්‍යාපනය ඇරඹීම (අකුරු කියවීම)

ලංකාවේ ද අතීතයේ සිට ම කෙනෙකුගේ උත්පත්තියෙන් පසුව නම් තැබීම, ඉඳුල් කටගෑම, අකුරු කියවීම, විවාහය වැනි අවස්ථාවල උත්සව පැවැත්වීමේ සිරිතක් පැවතුණි.

පරපුරෙන් පරපුරට උරුම වීමෙන් වර්තමානයේ පවා මෙබඳු අවස්ථාවල උත්සව පැවැත්වේ. මේවා බොහෝ විට නිවාස ආශ්‍රිතව සිදු කරන උත්සව වේ. ඊට අමතරව ජනතාව එකතු වී පවත්වන පොදු උත්සව රැසක් ද පවතී. රජරට ශිෂ්ටාචාර සමයේ දී පැවැත්වූ එබඳු උත්සව කිහිපයක් පහත දැක්වේ.

වෙසක් උත්සවය

ජල ක්‍රීඩා උත්සවය

වප්මගුල් උත්සවය

වර්තමාන සමාජයේ ද වර්ෂයේ යම් යම් කාල පරිච්ඡේදවල පවත්වන උත්සව රැසක් පවතී. වෙසක් උත්සවය, ඇසල පෙරහර, උපසම්පදා උත්සවය ආදියට අතීතයේ සිට පැවති යම් යම් උත්සව හා සිරිත් විරිත්වල ආභාසය ලැබී තිබේ. ඒවා ද පරපුරෙන් පරපුරට පැමිණි අස්පෘශ්‍ය උරුමයන් ම වේ.

අපේ රටේ බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආදි විවිධ ආගම් අදහන ජනතාව ජීවත් වෙති. ඒ ඒ ආගම් හා සංස්කෘතීන්වල චාරිත්‍ර වාරිත්‍ර ආදිය විවිධ වේ. සිංහල අවුරුදු උත්සවය බොහෝ විට බෞද්ධ සිරිත් විරිත්වලට මුල් තැනක් දී පැවැත්වේ. හින්දු ජනතාවගේ තෛපොංගල් උත්සවය හා ඉස්ලාම් ජනතාවගේ රාමලාන් උත්සවය ආදියෙහි ඒ ඒ ආගමික සිරිත් විරිත්වලට මුල් තැනක් ලැබේ. මේ සියලු උත්සව සමග බැඳි සිරිත් විරිත් පරපුරෙන් පරපුරට පැමිණි අස්පෘශ්‍ය උරුමයකි.



රූපය 3.18 මහනුවර දළදා පෙරහැර

### ක්‍රියාකාරකම

තමන්ට සම්බන්ධ උත්සව අවස්ථාවක් තෝරාගෙන එහි ඇති චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

### ස්වභාව ධර්මයෙන් බාහිර ආභාසයෙන් ඇති වූ දැනුම හා පුරුදු

දිගු ඉතිහාසයක් ඇති රටක් වශයෙන් අතීත මිනිස් අත්දැකීම් තුළින් උරුම වූ සාම්ප්‍රදායික දැනුම් සම්භාරයක් අප සතුව පවතී. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී වැව් තැනවීම, සොරොව්ව සැකසීම, ඇළ මාර්ග තැනීම, භෝග වැපිරීම, වගාව රැක බලා ගැනීම, අස්වනු නෙළීම ආදිය අතීතයේ සාම්ප්‍රදායික දැනුම වශයෙන් පැවතුණි. වගාවට වැළඳෙන ලෙඩ රෝග, ඒවාට යෙදිය යුතු පිළියම්, කෙම් ක්‍රම වැනි දේ ද එසේ පරපුරෙන් පරපුරට



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

පැවති සාම්ප්‍රදායික දැනුමට උදාහරණ වේ. සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම, වඩු කර්මාන්තය, මැණික් කර්මාන්තය ආදී බොහෝ ශිල්ප ක්‍රමවල මෙබඳු සාම්ප්‍රදායික දැනුමක් පවතී. ඒවා ද ජාතියක් සතු අස්පෘශ්‍ය උරුමයේ කොටසකි.



රූපය 3.19 පැදුරු විවීම

## සාම්ප්‍රදායික කලා ශිල්ප

මෙරට සාම්ප්‍රදායික කලා ශිල්ප දෙස බලන විට අතීතයේ සිට පැමිණි දැනුම වර්තමානයේ පවා ඒ ඒ කලා ශිල්ප වෙනුවෙන් යොදා ගනු පෙනේ. කැටයම් කලාව, බිතු සිතුවම් කලාව, පැදුරු විවීම, පිත්තල භාණ්ඩ තැනීම හා ඔප දැමීම, වෙස් මුහුණු හා රූකඩ කලාව, ලාක්ෂා කලාව ආදිය එයට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.



රූපය 3.20 පන් කොළවලින් සකස් කළ අත් බෑග් හා පසුම්බි

## අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම

කුඩා රටක් වුව ද ඉපැරණි ඉතිහාසයක් හා සංස්කෘතික උරුමයන් රැසක් අප රට සතු බව මෙම පාඩමේ දී ඔබට වැටහෙන්නට ඇත. ස්පෘශය හා අස්පෘශ්‍ය වශයෙන් වෙන් කර ඇති මෙම සංස්කෘතික උරුමය පරම්පරාවෙන් පරම්පරාවට රැක ගනිමින් වර්තමාන සමාජයට උරුම වී තිබේ.



රූපය 3.21 පිත්තල කැටයම් කලාව



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## වෙස් මුහුණු හා රූකඩ කලාව



රූපය 3.22

විවිධ ශාන්තිකර්ම හා බලි තොවිල් උදෙසා වෙස් මුහුණු නිර්මාණය කෙරිණ. මෙහි දී යක්ෂ හා දේව රූප බොහෝ විට වෙස් මුහුණු සඳහා යොදා ගැනේ. සංත්‍රාසය හා තේජස වැනි හැඟීම් ජනිත කිරීමට වෙස් මුහුණු යොදා ගෙන ඇත. අම්බලංගොඩ හා උඩුපිල වැනි ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයට අයත් ගම්මාන වෙස් මුහුණු නිර්මාණය සඳහා ප්‍රසිද්ධියට පත්ව තිබේ.

## ලාක්ෂා චිත්‍ර කලාව



රූපය 3.23

කන්ද උඩරට ප්‍රදේශය මේ කර්මාන්තයට වඩාත් ප්‍රසිද්ධ ය. කැප්පෙට්ටියා ශාඛයේ වසන ලාක්ෂා කෘමියාගේ ශ්‍රාවයකින් මෙම කර්මාන්තය සඳහා වූ අමුද්‍රව්‍ය සකසා ගැනේ. හැරමිටි, බස්තම්, දව හෙප්පු, බඳුන්, ගෘහ භාණ්ඩ, වටාපත් මිට, සේසත් හා පුස්කොළ පොත් ආදියේ පිටත අලංකරණය සඳහා ලාක්ෂා කර්මාන්තය යොදා ගැනිණ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමේ වටිනාකම

රළු කළු ගලකින් වුව ද දුටුවන්ගේ නෙත් සිත් පිනවන ඉතා උසස් කලාත්මක නිර්මාණ මතු කර ගැනීමට අපේ අතීත මුතුන් මිත්තෝ සමත් වූහ. නිර්මාණශීලිත්වය හා ඒ පිළිබඳව වූ දැනුම, රට, දැය, ආගම පිළිබඳව ඔවුන් තුළ තිබූ යහපත් ආකල්ප හා ඔවුන්ගේ එම අත්දැකීම් මෙම උරුමයන් සමඟ බැඳී පවතින බැවින් අනාගත පරපුරට ද ඒවා ලබා ගැනීම සඳහා අපේ උරුමයන් රැක ගත යුතු ය.

ලෝකයේ පවතින විවිධ රටවලට ඒ රටවලට ආවේණික වූ සංස්කෘතීන් ඇත. එම විවිධ සංස්කෘතීන් අතර ශ්‍රී ලාංකික සංස්කෘතිය ලොව හමුවේ දැක්වීමට හා අපේ අභිමානය පෙන්වීමට අපේ සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම වැදගත් වේ. අපේ සංස්කෘතියෙන් ලෝක උරුම බවට පත් වූ ස්ථාන හයක් පිළිබඳ ඔබ මීට පෙර දී ඉගෙන ගන්නට ඇත. එසේ ලෝක උරුම බිහි වීමෙන් අපේ ජාතික උරුමයන් පිළිබඳ ලොව ම දැනුම්වත් වෙයි. එය අපගේ සංචාරක කර්මාන්තයේ දියුණුවට ද හේතු වේ.

අපේ පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණශීලිත්වය, කලාත්මක හැකියා, දක්ෂ ඉන්ජිනේරු ශිල්පය, තාක්ෂණය පිළිබඳ දැන ගැනීමෙන් අපේ රට පිළිබඳ අභිමානයක්, ඇල්මක් ඇති වේ.

අපේ ප්‍රධාන ආහාරය වන බත් සඳහා අවශ්‍ය වී තවමත් වගා කරන්නේ අතීත මුතුන් මිත්තන් උරුම කර දුන් වැව් අමුණු පද්ධතිය ඇසුරෙනි.

අතීත උරුමය වර්තමාන සමාජයේ පැවැත්මට උපකාරී වී ඇති අයුරු එයින් ද පැහැදිලි වේ.

සංස්කෘතික උරුමයන් ද එසේ ය. අතීතයෙන් උරුම වූ යහපත් සිරිත් විරිත් හා පුරුදු වර්තමාන සමාජයේ පැවැත්මට අවශ්‍ය වේ. මේ සියලු සංස්කෘතිකාංග අපට උරුම වූයේ පැරණි මුතුන් මිත්තන් ඒවා ආරක්ෂා කොට අපට දායාද කළ බැවිනි. එබැවින් ඒවා ආරක්ෂා කොට අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීම අපේ වගකීමකි.

### ක්‍රියාකාරකම

අපේ සංස්කෘතික උරුමය රැකගනිමු. මාතෘකාව යටතේ රචනාවක් ලියන්න.

### සාරාංශය

- ශ්‍රී ලංකාව සංස්කෘතික උරුමයන් බොහොමයකට උරුමකම් කියන රටකි.
- සංස්කෘතික උරුමය ස්පෘශ හා අස්පෘශ ලෙස කොටස් දෙකකින් යුක්ත වේ.
- ශ්‍රී ලංකාවෙන් ලෝක උරුම හයක් දායාද කර ඇත.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය ලෝකය හමුවේ පෙන්වීමටත් අපේකම රැක ගැනීමටත් අපේ උරුමය අප ආරක්ෂා කළ යුතුය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.